# උත්ථාන සමයේ පස්වන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 15 : 7 – 21

**"අන්‍ය ජාතිකයන් වෙතින් ස්වාමින් වහන්සේ වෙත හැරෙන්නවුන් නොසන්සුන් බවට පත් නොකරන්න."**

දීර්ඝ විවාදයක් ඇතිවූ පසු පේදුරු නැගිට ඔවුන් අමතා "සහෝදරයෙනි, විජාතීන් මාගේ මුඛයෙන් පණිවුඩය අසා අදහන පිණිස බොහෝ කලකට ඉහත දෙවියන් වහන්සේ ඔබ අතරෙන් මා තෝරාගත් බව ඔබ දන්නාහුය. සියලු සිත් දන්නා වූ දෙවියන් වහන්සේ අපට මෙන්ම ඔවුන්ටත් ශුද්ධාත්මයාණන් දී ඔවුන් ද පිළිගත් අය බවට සාක්ෂි දුන් සේක. උන්වහන්සේ, ඔවුන් සහ අප අතර කිසි වෙනසක් නොකොට, ශ්‍රද්ධාව කරණකොටගෙන ඔවුන්ගේ සිත් පවිත්‍ර කළ සේක. එබැවින් අපගේ පියවරුන්ටවත් අපටවත් දැරිය නොහැකි වියගසක් ගෝලයන්ගේ කරපිට තැබීමෙන් ඔබ කුමක් නිසා දෙවියන් වහන්සේ පිරිස්සන්නහුද? එසේ නොව, ඔවුන් මෙන්ම අපත් ගැලවෙන්නේ ජේසුස් ස්වාමින් වහන්සේගේ වරප්‍රසාදයෙන් බව විශ්වාස කරමු" යි කීය. එවිට මුළු සමූහයා නිශ්ශබ්ද වී තමන් ලවා දෙවියන් වහන්සේ විජාතීන් අතරේ දැක්වූ ලකුණු ද අරුම පුදුම දේ ද ගැන පාවුලු සහ බර්ණබස් කී සියල්ලට සවන් දුන්හ. ඒ දෙදෙනා කතා කර නිමවූ පසු ජාකොබ් පිළිතුරු දෙමින් "සහෝදරයෙනි, මට සවන් දුන මැනව. දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ නාමය දැරීමට විජාතීන් අතුරෙන් සෙනඟක් තෝරා ගන්නා පිණිස මුල පටන්ම ක්‍රියා කළ සැටි සීමොන් කියා දුන්නේය. දිවැසිවරුන්ගේ වචනයෙන් ද එය අනුමත වේ. ඒ මෙසේය.

'මින්පසු මම හැරී අවුත් දාවිත්ගේ වැටී ගිය මණ්ඩපය නැවත සාදා,

එහි නටඹුන් තැන් ද යළිත් ගොඩ නගා,
සවිමත් කරන්නෙමි.
එවිට අවශේෂ මනුෂ්‍යයන් ද මාගේ නාමය දරන සියලු ජාතීන් ද,
ස්වාමින් වහන්සේ සොයන්නෝය.
ලෝකය පටන් ගැන්මේ සිට ක්‍රියා කරන ස්වාමින් වහන්සේ මේ සියල්ල
වදාරණ සේක.

“එබැවින් මාගේ නිගමනය නම් විජාතීන් අතර දෙවියන් වහන්සේ වෙතට හැරෙන්නන්ට තවත් හිරිහැර නොකොට, රූප සම්බන්ධ දූෂණ කම් වලින් ද, කාමමිථ්‍යාචාරයෙන් ද බොටුව මිරිකා මැරූ සතුන්ගේ මස් කෑමෙන් ද ලෙයින් ද වැළකෙන ලෙස ලිපියකින් දන්වා යැවිය යුතුය. යනුයි. මන්ද, ආදි පරම්පරාවල සිටම මෝසෙස්ගේ ව්‍යවස්ථාව ප්‍රකාශ කරන්නෝ සියලු නගර වල සිටිති. ඔව්හු සියලු සබත් දිනවල එය ධර්මශාලාවල දී කියවති” යි කීහ.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 96 : 1–3, 10

පිළිතුර: ජනතාවන් අතර සමිඳුන්ගේ ප්‍රබල ක්‍රියා පවසන්න.

ගීය:

සමිඳුන් හට නව ගීයක් ගයන්න. පොළෝ වැසි සියල්ලෙනි සමිඳුන් හට ගී ගයන්න. සමිඳුන් හට ගී ගයා එතුමන්ගේ නාමයට ආසිරි පතන්න.

සමිඳුන්ගේ ගැළවීමේ සුබාරංචිය දිනෙන් දින ප්‍රකාශ කරන්න. විජාතීන් අතර එතුමන්ගේ මහිමය ප්‍රකාශ කරන්න. ජනතාවන් අතර එතුමන්ගේ ප්‍රබල ක්‍රියා පවසන්න.

විජාතීන් අතර මෙසේ පවසන්න. සමිඳාණෝ රජකම් කරන සේක. නොසැලෙන ලෙස ලෝකය පිහිටා ඇත. එතුමාණෝ සාධාරණ ලෙස ජනතාවන් විනිශ්චය කරන සේක.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"තෝමස්, ඔබ දුටු බැවින් අදහා ගත්තෙහිය.
නොදුටු නමුත් අදහන්නෝ භාග්‍යවන්තයෝ ය" යි වදාළ සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 15: 9-11

**"මාගේ ප්‍රේමයෙහි පවතින්න. ඔබේ ප්‍රීතිය පරිපූර්ණ වන්නේය."**

"පියාණන් වහන්සේ මට ප්‍රේම කළාක් මෙන් මම ද ඔබට ප්‍රේම කළෙමි. මාගේ ප්‍රේමයෙහි පවතින්න, මා මාගේ පියාණන් වහන්සේගේ ආඥා පිළිපැද උන්වහන්සේගේ ප්‍රේමයෙහි පවතින සේම, ඔබත් මාගේ ආඥා පිළිපදින්නහු නම්, මාගේ ප්‍රේමයෙහි පවතින්නහු ය. 'මේ දේවල් මා ඔබට ප්‍රකාශ කළේ, මාගේ ප්‍රීතිය ඔබ තුළ ඇතිවන පිණිසත් ඔබේ ප්‍රීතිය පරිපූර්ණ වන පිණිසත් ය."

සුවිශේෂ වාක්‍යය එසේය.

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 15 : 18–21

**"ඔබ ලෝකයට අයිති නැත.**
**මම ඔබ තෝරා ගතිමි."**

ලෝකයා ඔබට ද්වේශ කරත් නම්, ඔබට පෙර මටත් ද්වේශ කළ බව දැනගන්න. ඔබ ලෝකයට අයිති නම් ලෝකයා ස්වකීය අයට මෙන් ඔබට ඇලුම් වනු ඇත. එහෙත් ඔබ ලෝකයට අයිති නොවන නිසා, ලෝකයා කෙරෙන් මා ඔබ තෝරා ගත් නිසා ලෝකයා ඔබට ද්වේශ කරති. "දාසයෙක් තම ස්වාමියාට වඩා උතුම් නොවේ ය" යි මා ඔබට වදාළ වචනය සිහි කරන්න. ඔහු මට පීඩා කළෝ නම් ඔබටත් පීඩා කරන්නෝය. මාගේ වචනය පිළිපැද්දෝ නම්, ඔබගේ වචනයත් පිළිපදින්නෝ ය. එහෙත්, ඔවුන් මා එවා වදාළ උන්වහන්සේව නාදුනන බැවින්, මාගේ නාමය නිසා මේ සියල්ල ඔවුන් ඔබට කරනු ඇත."

සුවිශේෂ වාක්‍යය එසේය.